**තිරසාර විදුලි බල අංශ සහාය ව්‍යාපෘතිය 07 හා 08 කොටස් - 2015**

---

තිරසාර විදුලි බල අංශ සහාය ව්‍යාපෘතියේ 07 හා 08 කොටස් සඳහා 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 ජූනි 20 දින එළඹි අංක 2733 එස්ආර්අයි (එස්එෆ්) හා අංක 2734 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.05 (අ) සහ 4.03 (අ) වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, විදුලි බල සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ 01 සිට 06 කොටස්, 09 හා 10 කොටස් සඳහා ලංකා විදුලි බල මණ්ඩලය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන අතර ව්‍යාපෘතියේ 07 සහ 08 කොටස් සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ 07 සහ 08 කොටස් යටතේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන කාර්යයන් පිළිබඳ විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, විශ්වාසදායී, ප්‍රමාණවත් සහ දැරිය හැකි විදුලි බල සැපයුම ආවරණය වන ප්‍රදේශය පුළුල් කිරීම සහ (i) නැගෙනහිර , උතුරු මැද, දකුණු හා ඌව පළාත්වල සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීම. (ii) නැගෙනහිර හා ඌව පළාත්වල ග්‍රාමීය විදුලි සැපයුම පුළුල් කිරීම සහ, (iii) බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ වැඩිදුර සංවර්ධනය මඟින් සේවා බෙදා හැරීමේදී කාර්යක්ෂමතාවය සහ විශ්වාසදායී බව වැඩි දියුණු කිරීමයි. ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,135 කට සමාන එජඩො මිලියන 162.03 ක් වන අතර ඉන් සියයට 1.19 ක් හෙවත් රු.මිලියන 216.16 කට සමාන එජඩො මිලියන 1.93 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. 2011 නොවැම්බර් 17 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2014 අප්‍රේල් 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. ණය කාලපරිච්ඡේදය 2016 ඔක්තෝබර් 30 දක්වා දීර්ඝ කරන ලදී.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම්

තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වර්ධනය කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව හා 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඊ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(උ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(එ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඔ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව .

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2..** **මූල්‍ය ප්‍රකාශන**

**--------------**

**2.1** **මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර, මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**--------------------------------------**

**2.2.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**--------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 දරන චක්‍රලේඛය අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනට හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2017 ජූලි 19 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම 19 ඡේදයේ අවශ්‍ය පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකරණයේ වගකීම පිළිබඳ ප්‍රකාශය ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය

(අ) පාරිසරික බලපෑම් පරීක්ෂාව සඳහා ප්‍රසම්පාදනය කරන ලද රු.මිලියන 41.81 ක්වූ උපකරණ හා ශීතකරණ, දේපල, පිරියත හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත කරනු වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

(ආ) ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යන ලද අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් මස පැවති රු.මිලියන 20 ක ශේෂය මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙහි කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් සමාලෝචිත වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් 2015 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ | 1.93 | 216.16 | 125.00 | 0.02 | 2.90 | 0.28 | 38.60 |
| ශ්‍රීලංර | 0.09 | 10.01 | 1.00 | - | 0.20 | 0.05 | 7.50 |
| එකතුව | 2.02 | 226.17 | 126.00 | 0.02 | 3.10 | 0.33 | 46.10 |

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, ව්‍යාපෘතියේ 07 සහ 08 කොටස් සඳහා ප්‍රධාන අපේක්ෂිත ප්‍රතිඵල වන්නේ, බලශක්ති කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සංවර්ධනය කිරීමයි. එබැවින් වතු අංශයේ විස්තරාත්මක තාක්ෂණික අධ්‍යයනයන් සිදු කිරීම සඳහා උපදේශක සහායන් හා කුඩා විදුලිබල පුනරුත්ථාපන හා ග්‍රිඩ් සම්බන්ධතා සඳහා මූල්‍යයන කාර්යයන් වලට යෝග්‍ය නිර්නායකයන් සංවර්ධනය කිරීම වැනි කාර්යයන් ව්‍යාපෘතිය විසින් සිදුකිරීම අපේක්ෂා කර තිබුණි. තවද, ඉංජිනේරු, පාරිසරික හා සමාජ නියාමනයන් සම්බන්ධ කරුණු පිළිබඳ ඇගයීම්, ශුද්ධ මීටර් කිරීමේ පදනම මත මෙගාවොට් 1.3 ක ග්‍රිඩ් සම්බන්ධිත ධාරිතාවය සපයන කුඩා - ජල විදුලිබල ව්‍යාපෘති 19 ක් සඳහා පුද්ගලික සංවර්ධනකරුවන්ට එජඩො මිලියන 1.29 ක් වටිනා ණය සැපයීම ස්ථාපිත කිරීම සහ ආලෝක පරීක්ෂණ, රසායනාගාර උපකරණ මිලදී ගැනීම වැනි වෙනත් කාර්යයන් ද සිදු කිරීම අපේක්ෂා කර තිබුණි. ලැබුණු තොරතුරු අනුව, ව්‍යාපෘතිය විසින් පත්කරන ලද උපදේශකවරයකු විසින් පිළියෙල කරන ලද ශක්‍යතා අධ්‍යයන වාර්තා සමාලෝචිත වර්ෂය තුළදී බලපත්‍රලාභී වාණිජ බැංකු 02 කට ඉදිරිපත් කර තිබූ අතර, ඒ සඳහා උප ණය ලබාදීමට 2015 දෙසැම්බර් 31 දිනෙන් පසු කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන්, 2015

දෙසැම්බර් 31 දිනට මාස 10 ක් වන ඉතිරි කාලපරිච්ඡේදය තුළ ව්‍යාපෘතියේ අරමුණු ළඟා කරගැනීමට නොහැකි වන බව නිරීක්ෂණය විය.

### 3.3 මූල්‍ය පාලනය පිළිබඳ කරුණු

**------------------------------**

මුදල් රෙගුලාසි 134 (3) සහ 2010 ජූලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ අවශ්‍ය පරිදි, ව්‍යාපෘතියේ ගනුදෙනු සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනය සඳහා භාජනය කර නොතිබුණි.